# සැබෑ රණවිරුවෙකුගේ අභීත ක්‍රියාකාරකම්!

**පසුගිය සතියේ රුදුරු දෙමළ කොටි ත්‍රස්තවාදියෙකුගේ බෝම්බ පහරකින් ජීවිතක්ෂයට පත්වූ මේජර් ජෙනරාල් ජානක ඉන්දුජිත් පෙරේරා නම් අභීත සෙන්පතියා ශ්‍රීලංකා මාතාවට අපමණ ආඩම්බරයට පත්විය හැකි ඇයගේ මාහැඟි පුත්රුවනකි. තම උපන් දේශය රැකගැන්මට ජීවිතයේ සැහෙන කාලයක් සටන් බිමේ සැබෑ සටන්කාමියෙකු ලෙස සටන්වැද අවශේෂ භට පිරිසටද ඉදිරියට යාමට ශක්තිය ද ධෛර්‍යය ද ආදර්ශයද උපරිම ලෙස සම්පාදනය කළ ඔහු වැනි විරුවන් අපේ ඉතිහාසය පුරා නොමැකී හිඳිති. ජානක පෙරේරා සෙන්පතිඳුන් වීර චරිතයක් පරිද්දෙන් කෙළෙහිගුණ දත් ශ්‍රීලංකාවාසී ජනතාවගේ සිත්සතන්හි සැමදා ජීවත්වෙනවා ඇත.**

මේජර් ජෙනරාල් ජානක පෙරේරා මහතා හමුදා සේවයෙන් විශ්‍රාම ගන්නා විට මාණ්ඩලික ප්‍රධානි **Chief of Staff** වශයෙන් කටයුතු කරමින් සිටියේය. කැඩෙට් නිලධාරියෙකු ලෙස යුද හමුදාවට බැඳුණු ඔහු එක්සත් රාජධානියේ සැන්ඩ්හර්ස්ට් රාජකීය හමුදා විද්‍යා පීඨයෙන් මූලික පුහුණුව ලබා ඉන්ජිනේරු රෙජමේන්තුවේ දෙවැනි ලුතිනන්-වරයෙකු ලෙස සිය හමුදා ජීවිතය ඇරඹීය. තිස්පස් වසරක සිය හමුදා සේවා කාලය තුළ විවිධ උසස් තනතුරු රැසක් හෙබවූ මේජර් ජෙනරාල් පෙරේරා අවසන් වරට යුද හමුදා-වේ දෙවන ප්‍රධාන තනතුර වන මාණ්ඩලික ප්‍රධානී තනතුර ඉසිලීය. එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහිව සටන් මෙහෙයවා ජයග්‍රහණ රැසක් හමුදාවට හිමිකරදුන් දක්ෂ යුද සෙන්පතියෙකු ලෙස ප්‍රකට හෙතෙමේ 1995 වසරේ දී යාපනය මුදාගත් ඓතිහාසික **රිවිරැස** මෙහෙයුමේ ප්‍රධාන සටන් සේනාංකය වූ 53 වන සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් කටයුතු කළේය. එම සේනාංකයේ ආරම්භක සේනාංකාධිපති සහ ස්වාධීන බලසේනාවේ ආරම්භක බලසේනාධිපති වශයෙන්ද හමුදා ඉතිහාසයට එක්වූ මේජර් ජෙනරාල් පෙරේරා **රණවික්‍රම**, **රණශූර** යන වික්‍රමාන්විත පදක්කම් හා **විශිෂ්ඨ සේවා** සහ **උත්තම සේවා** යන පදක්කම් හිමිකරගත් නිලධාරියෙකි. 1986 සිට 88 දක්වා වැලිඔය සම්බන්ධීකරණ නිලධාරි වශයෙන් කටයුතු කළ හෙතෙම වැලිඔය මහවැලි කලාපයට අයත් ජනකපුර ඇතුළු නව ගම්මාන රැසක් බිහිකර සාමාන්‍ය සිංහල වැසියන් එහි පදිංචි කරවීමට මූලිකව ක්‍රියා කළේය. හමුදා සේවයෙන් විශ්‍රාම ගත් පසු ඕස්ට්‍රේලියාවේ ශ්‍රීලංකා මහකොමසාරිස්වරයා ලෙස වසර කීපයක් සේවය කර අනතුරුව ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් ලෙසද කටයුතු කළේ ය.

සිය හමුදා ජීවිතයේ නොමැකෙන සටහන් රැසක් තැබූ මේජර් ජෙනරාල් ජානක පෙරේරා 1995 වසරේ වැලිඔය 06 වෙනි බලසේනාධිපතිව සිටියදී වැලිඔයට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කිරීමට පැමිණි කොටි ත්‍රස්තවාදීන් 500 ක් පමණ එකම රැයකදී මරා දමා වැලිඔය රැකගැනීමට සිය නායකත්වය ලබාදී විශිෂ්ඨ ජයග්‍රහණයක් හිමිකර ගත්තේය. එය එදා මෙදා තුර ඊළාම් සටන් ඉතිහාසයේ හමුදාවට සිදුවූ හානි අවම කරගනිමින් එකවර එකම ස්ථානයකදී කොටි ත්‍රස්තවාදීන් විශාල පිරිසක් ඝාතනය කළ අවස්ථාව ලෙස සනිටුහන් වී ඇත. එම සටනේදී මිය ගියේ හමුදා සෙබළුන් දෙදෙනෙකු පමණි.

2000 වසරේදී '**නොනවතින රැල්ල**' කොටි මෙහෙයුම හමුවේ යාපනය අර්ධද්වීපයේ ආරක්ෂක හමුදා ජීවිත 35,000 ක් පමණ කොටි ත්‍රස්තවාදීන්ට ගොදුරුවීමට ඔන්න මෙන්න කියා තිබූ අවස්ථාවේදී ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපති වශයෙන් වහාම යාපනයට ගොස් යාපනය රැකගැන්මට මේජර් ජෙනරාල් පෙරේරා සමත් විය. යුදහමුදා කාන්තා බලකායේ ආරම්භක නිලධාරිනියක වූ වජිරා ද සිල්වා මෙනවිය සමග විවාහ වූ මේජර් ජෙනරාල් පෙරේරා දියණියන් දෙදෙනෙකු හා පුතුන් දෙදෙනෙකුගේ පියෙකි.

**ජානක පෙරේරා මහතා මේ පසුගිය අගෝස්තු මස 23 වෙනි දින පැවති උතුරු මැද පළාත් සභා මැතිවරණයේදී ඡන්ද එක්ලක්ෂ දහසය දාස් හාරසිය තිහක් ලබාගනිමින් උතුරු මැද පළාත් සභාවේ විපක්ෂ නායක ධුරයට පත්විය.**



Mrs Vajira Perera

## Vajira: One of the first six to join Army Women's Corps

Major General Janaka Perera's wife Vajira, 48, a victim of the suicide bomb attack in Anuradhapura yesterday, was an old girl of Vishaka Vidyalaya, Colombo.

She was one of the first six women officers to join the Sri Lanka Army Women's Corps at the inception of the new unit. She was trained at the Women's Royal Army Corps College in UK in 1980 and served in the Sri Lanka Army for a brief period.

She resigned from the Army in 1982 to get married to Major General Perera who held the appointment of Military Liaison Officer at the Defence Ministry at that time.

Vajira who was a housewife after marriage, rendered a great service to the military community as a military wife until Major General Perera's retirement.

She accompanied her husband to Australia and Indonesia on him being appointed the Sri Lankan High Commissioner to Australia and Indonesia. On completion of the diplomatic posts they returned to Sri Lanka.

ජානක පෙරේරා මහතා සමගම අනුරාධපුරයේදී මිය ගිය ඔහුගේ බිරිඳ වජිරා පෙරේරා මහත්මිය කොළඹ විශාඛා විදුහලේ ආදි ශිෂ්‍යාවකි. ඇය ශ්‍රීලංකා හමුදාවට ප්‍රථම යෙන් බැඳුණු කාන්තා නිලධාරිනියන් හය දෙනාගෙන් එක් කෙනෙකි. එංගලන්තයේ රාජකීය කාන්තා යුද විදුහලේ 1990 දී පුහුණුව ලත් ඇය ශ්‍රීලංකා හමුදාවට බැඳී කෙටි කලක් සේවය කරද්දී ජානක පෙරේරා මහතා හා විවාහවූවාට පසු සේවයෙන් ඉවත්වූවා ය. එහෙත් ඇය **සේවා වනිතා ඒකකයට** බැඳී හමුදාවේ කාන්තාවන් සඳහා විශාල සේවාවක් කළා ය. සිය සැමියා ශ්‍රීලංකා මහකොමසාරිස් ලෙස ඕස්ටේලියාවේ හා ඉන්දුනීසියාවේ සේවය කරද්දී ඇය සෙවනැල්ල මෙන් ඔහුට සමීපව සිටියා ය.



**Maj. Gen. Janaka Perera**
**01. 02. 1946 - 06. 10. 2008**

**In recognition of his dedicated service and in appreciation of his contribution to the Army, he was awarded the following decorations and gallantry awards.**

**යුද හමුදා සේවය සඳහා ඔහුගේ වූ දැඩි කැපවීම වටහාගනිමින් ඔහුගෙන් සිදුවූ මහඟු දායකත්වය ඉහළින් අගයකිරීම් වස් පහත සඳහන් වික්‍රමාන්විත පදක්කම් හා ගෞරව සම්මාන මේජර් ජෙනරාල් ජානක පෙරේරා සෙන්පතිට පිරිනමා ඇත. ඔහු කෙබඳු හමුදා නිලධාරියෙක්ද යන්න ඔහු එදා දිනූ මෙම සම්මාන රැසෙන් ඔප්පුවන්නේය. අපේ අවාසනාවට එවැනි සෙන්පතියෙකු අපේ දැයට අහිමි විය.**

**Rana Wickrema Padakkama** (RWP), **Rana Sura Padakkama** (RSP) **Vishishta Seva Vibhushanaya** (VSV) **Utthama Seva Padakkama** (USP), **Purna Bhumi Padakkama** (PBP), **North and East Operations Medal, Vadamarachchi Operation Medal, Riviresa Campaign Service Medal, Republic of Sri Lanka Armed Services Medal** 1972, **50th Independence Anniversary Medal** 1998, **Sri Lanka Army 50th Anniversary Medal** 1999, **Sri Lanka Armed Services Long Service Medal** 1979 **and President's Inauguration Medal** 1978.

-Courtesy - SL Army




## බිරිඳට කිරිබත් කැල්ලක් කවමින් ......

**ගිය අගෝස්තු මස පැවති පළාත්පාලන ඡන්දයෙන් දිනා උතුරුමැද පළාතේ විපක්ෂනායක ලෙස තේරී පත්වුණ දා පැවති උත්සවයේදී ජානක පෙරේරා මහතා සිය බිරිඳ වජිරාට කිරිබත් කැල්ලක් කවනු මේ ඡායාරූපයෙන් පෙනේ. එහෙත් ඒ ප්‍රීතිය ඉතා කෙටි කාලීන බවත්, මාරයා ඔවුන් දෙදෙන අසලම ගැවෙ-සෙමින් සිටින බවත් ඔවුන් පමණක් නොව අප කිසිවෙකු ද දැන සිටියේ නැත. ඉතා විචිත්‍ර ජීවිත දෙකක් එසේ අවාසනාවන්ත ලෙස අවසන් වූයේ ය.**

**1 වන පිටුවෙන්.......**

## කොටි උගුල්. .....

ඇදගෙන ගොස් කොටි විසින් රඳවා තබාගනු ලැබ සිටිති. තවත් වැසියන් සංඛ්‍යාවක් පිටතට එනු නොහී එම දිස්ත්‍රික්කය ඇතුළත සිරවී සිටිති. කොටි මෙම මිනිසුන් තමන්ට මුවාවීමට මිනිස් පලිහක් වළල්ලක් ලෙස යොදා ගනු ඇත. ආරක්ෂක නිරීක්ෂක ඩී. බී. එස්. ජෙයරාජ් පෙන්වා දෙන්නේ හමුදාවන් ඉදිරියට යත්ම මෙම සිවිල් ජනතාව කොටි සමග මිශ්‍රවූ විට ඉන් එම වැසියන්ට හමුදාවෙන් මැරුම් කන්නට සිදුවන බැවින් මෙය රජයේ හමුදාව අපහසුතාවට පත්කරන කරුණක් වන්නේය යනුයි.

මේ සියල්ල සිදුවන අතරේ සාම කාක්කන්, මිනිස් අයිතිවාසිකම්කාරයින්, ඊනියා මානව හිතවාදීන්, බංකොළොත් ගසා වැලේ වැල් නැතිව සිටින වාමවාදීන් ආදී මෙකී නොකී කොටින්ට කත් අදින පෙරේතයින් කුම්භාණ්ඩයින් රැළද, කොටින්ගේ මුදල්වලින් යැපෙන එන්ජීඕ හැතිකරේද, කවදත් සිංහළයින්ට ගරහන බීබීසී ගුවන්විදුලි පිසාචයින්ද ඉදිරියට පැන කොටින්ගේ සහායට, කොටි වෙනුවෙන් මහා ගාලගෝට්ටියක් කරන්නට පටන්ගන්නවා ඇත. කොටින්ට අසුවී දුක්විඳිමින් සිටින සිවිල් ජනතාව ගැන මුන් එකෙක්වත් හඬක් නගන්නේ නැත. කොටි දකුණේ බස්රථවල බෝම්බ පුපුර-වා මිනිස් ඝාතනයේ යෙදෙන විට මුන් එකෙක්වත් ඇහැ අර බලන්නේ නැත. මේ මිනිස් අයිතිවාසිකම් ගැන කෑගහන පෙන්දන් එකෙක්වත් කට ඇරියේ නැත. නමුත් දැන් මාස කීපයක සිටම කොටින්ට රජයේ හමුදාවෙන් පහර වදින විට බීබීසී ලෝක සේවය ඇතුළු මේ පෙරේතයින් කෑගසන්නට පටන්ගෙන ඇත්තේ මානුෂිකව සිතීමෙන් නොව කොටි රැළ බේරාගැන්ම සඳහාය. ලංකාව ගැන බොහෝ විකෘති දේ බීබීසී පළකරන්නට පටන්ගෙන ඇත්තේ ඊට සූදානමක් ලෙසය. ගිය සතියේ ලංකාවේ තේවතු ගැන පළවූ විකෘති වැඩසටහන ඉන් එකකි. තේවතු ඒ තත්වයට ගෙනාවේ සිංහළ රජයන් නොව එකල අධිරාජයවාදී සුද්දන්ම බව බීබීසියට මතක්කර දෙන්නට කෙනෙක් නැත.

දකුණු ඉන්දියාවේ වෙසෙන කොටි හිතවාදී දෙමළ දේශපාලුවන් දැන් ඉන්දියානු රජයට බලකර සිටින්නේ නැවතත් 1989 දී මෙන් ගුවනින් පරිප්පු මිටියක් අතහැර ලංකා හමුදාවෙන් ප්‍රභාකරන් බේරා දෙන ලෙසයි.

දැන් දකුණට හා කොළඹට පැන සිටින කොටින්ද ඒපළාත්වල සිටින කොටි හිතවාදීන් ද උතුරේ කොටින්ට අවශ්‍ය උපකරණ රහසිගතව ප්‍රවාහනය කරන බව අසුවී ඇත. මේ ළඟදී හමුදාවෙන් අල්ලා පිරික්සුමට ලක් කළ උතුරට කෑම ගෙනයමින් තිබූ ලොරියක කාටවත් අසු නොවනසේ එහි පතුලේ වෙනම තැනූ පෙට්ටිවල සඟවා ඒවා තහඩු වලින් ආවරණය කර පාස්සා හොරෙන් ගෙන යන විද්‍යුත් භාණ්ඩ තොගයක්ම සොයා ගත හැකිවිය. ඒ සියල්ල මතුකර ගැන්මට පැය තුනක්ම ලොරිය කපන්නට හමුදා නිලධරීන්ට සිදුවිය. කොටි කොතරම් සූක්ෂම අන්දමට පරීක්ෂක කපොළු හා රැකවල් වලින් පැනයන්නට කටයුතු යොදා ඇත්දැයි මෙයින් පැහැදිලි වේ.

කොටින්ගේ මරාගෙන මැරෙන භට පිරිසේ තවත් ඉතිරිව සිටින මිනිස් බෝම්බ යවා කොළඹ හා ඒ අවට කොතැනදී හෝ ප්‍රභූන් රජයේ දේශපාලනඥයින් සේවයේ නියුතු හෝ විශ්‍රාම ගිය හමුදා නිලධාරීන් ඝාතනය කිරීම සිදු කෙරෙනවා ඇත. මේ සතියේ මුල අනුරාධපුර නගරයේදී එවැනි මරාගෙන මැරෙන කොටි තිරිසනෙකු විසින් මේජර් ජෙනරාල් ජානක පෙරේරා ඇතුළු තිස් ගණනක් ඝාතනය කරනු ලැබීමතුළින් ඒ බව මනාව පෙන්නුම් කෙරේ. මේ සියළු කොටි උගුල් දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

**උපාය දන්නා අපායේ නොවැටෙයි** යන සිංහළ කියමනක් ඇත. ඒ අනුව හොඳ සිහි නුවණින් කොටින්ගේ කූට උපායන් සියල්ල කල්පනාවට ගෙන උන් අභිබවා යමින් කොටි වසංගතය ලංකා භූමියෙන් යළිත් නොඑන්නටම වනසා දමන්නට අපේ සන්නද්ධ හමුදා ක්‍රියා කරනවා ඇත යන්න ලංකා ජනතාවගේ ඒකායන විශ්වාසයයි.